# මහජන ආරක්ෂක අමාත්‍යාංශය
# பொதுமக்கள் பாதுகாப்பு அமைச்சு
# Ministry of Public Security

14 වන මහල, "සුහුරුපාය", බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
14 வது மாடி, சுகுறுபாய, பத்தரமுல்ல, இலங்கை.
14th Floor, 'Suhurupaya', Battaramulla, Sri Lanka.

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දුරකථන / தொலைபேசி / Telephone: 011 2886067, 011 2887268, 011 2887307
ෆැක්ස් / பெ. / Fax: 011 2887756, 011 2887238
ලේකම් / செயலாளர் / Secretary: දුර./ தொ./ Tel : 011 2868145; ෆැක්ස්/ பெ./ Fax : 011 2868135


දිනය / திகதி / Date: 2021.06.04

අධ්‍යක්ෂ / කර්තෘ
මුද්‍රිත - විද්‍යුත් මාධ්‍ය

**<u>ෂැංග්‍රිලා හෝටලයේ උපන්දින සාදයට අදාලව අත්අඩංගුවට ගත් පිරිස නිරෝධායනයට යොමු කිරීම - බස්රථය ආපසු හැරවීම යන ව්‍යාජ පුවත</u>**

ඉහත සිද්ධියට අදාලව මේ දිනවල විවිධ මාධ්‍ය ජාලාවල මෙන්ම සමාජ මාධ්‍ය ජාලාවල අසත්‍ය පුවතක් පළ වී ඇති බැවින් ඒ සම්බන්ධයෙන් පහත පරිදි කරුණු පැහැදිලි කරමි.

- 2021.06.02 දින සන්ධ්‍යා කාලයේදී මහජන ආරක්ෂාව පිළිබඳ ගරු අමාත්‍ය සරත් වීරසේකර මහතා හට මංජු ශ්‍රී නැමති නීතිඥ මහතා කතා කොට ඔහුගේ සේවාදායකයින් බදුල්ල නිරෝධායන මධ්‍යස්ථානයක් වෙත ගෙන යන බවත් ඔවුන් සතුව මූලික අවශ්‍යතා පවා නොමැති බවත් පවසන ලදී. ඉන්පසු යම් කාන්තාවක් දුරකථන ඇමතුමක් ලබාදෙමින් තමා පියුමි හංසමාලී නැමැත්තිය බවත් තමා ඇතුළු කණ්ඩායමක් තමන් ඇඳන් සිටින ඇඳුම් පිටින්ම නිරෝධායනය සඳහා බදුල්ලට රැගෙන යන බවත් සඳහන් කරමින් තමන් ඇතුළු පිරිසට අමතර ඇඳුම් ආදිය රැගෙන යාමට අවස්ථාවක් ලබාදෙන ලෙසත්, පොලිසිය භාර ඇමතිවරයාගෙන් ඉල්ලීමක් කර ඇත.
- ඉන් අනතුරුව චන්දිමාල් ජයසිංහ නැමැති අයද දුරකථන ඇමතුමක් ලබාදෙමින් ඉහත ඉල්ලීම සනාථ කරමින් ආයාචනයක් කර ඇත.
- ඉන්පසු ගරු ඇමතිතුමා විසින් මේ සම්බන්ධයෙන් පොලිස්පති සහ බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වෙත දැනුම් දීමෙන් අනතුරුව ඔවුන්ව තලංගම පොලිස් ස්ථානය වෙත රැගෙන ගොස් ඔවුන් බස්රථයේම සිටියදී අදාල ඉල්ලීම පරිදි ඔවුන්ගේ නිවෙස්වලින් අවශ්‍ය ඇඳුම් ඇතුළු සුහසාධක ද්‍රව්‍ය ගෙනත් දීමට අවසථාවක් සළසා අදාල බස්රථය නිරෝධායන නියෝගය පරිදි බදුල්ල පස්සර නිරෝධායන මධ්‍යස්ථානය වෙත පිටත්කර යවා ඇත.
- මෙහිදී කිසිදු අවස්ථාවක මෙම බස්රථය ආපසු හරවන ලෙස හෝ නිරෝධායනයට ලක්විය යුතු පිරිස නිරෝධායනයට ලක් නොකරන ලෙස හෝ ගරු ඇමතිතුමා විසින් කිසිම උපදෙසක් / නියෝගයක් ලබාදී නොමැති අතර, ශ්‍රී ලංකා පොලීසිය භාර අමාත්‍යවරයා ලෙස මහජනතාව විසින් කරන ලද ඉල්ලීමක් සානුකම්පිතව සළකා බලා ඉහත පරිදි අවශ්‍ය උපදෙස් දීමක් සිදුවූවා මිස වෙනත් උපදෙසක් ලබා දී නොමැති බව අවධාරණය කරමි.
- මෙම සිදුවීමේදී පමනක් නොව මහජනතාව විසින් පොලීසිය සම්බන්ධව ඉදිරිපත් කරන විවිධ ප්‍රශ්ණවලදී ගරු අමාත්‍යවරයා විසින් මහජනතාවට සවන් දෙමින්, මැදිහත්වෙමින් ක්‍රියාකර ඇත.
- ඉහත සිදුවීමට අදාලව ව්‍යාජ හා අසත්‍ය තොරතුරු විවිධ පුද්ගලයින් විසින් ද්වේශසහගතව ප්‍රචාරය කර ඇති බැවින් ඔබ මාධ්‍ය ආයතනය විසින් මේ පිළිබඳව නිවැරදි පුවත සහිතව ප්‍රචාරය ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

එම්. චින්තක ලසන්ත පෙරේරා
සාම විනිසුරු (මුළු දිවයිනටම)
ගරු මහජන ආරක්ෂක අමාත්‍යතුමාගේ
මාධ්‍ය ලේකම්
මහජන ආරක්ෂක අමාත්‍යාංශය
15 වෙනි මහල, "සුහුරුපාය", බත්තරමුල්ල.

එම්.චින්තක ලසන්ත පෙරේරා
ගරු මහජන ආරක්ෂක අමාත්‍යතුමාගේ මාධ්‍ය ලේකම්.